00028

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම **2018/2019**

අවසාන පරීක්ෂණය - **2019**

ළමා අයිතිවාසිකම් - **ESU3130/STU5330**

කාලය පැය තුනයි. **(03)**

---

දිනය - **2019.02.20** වේලාව - ප.ව.**01.30** - ප.ව.**04.30** දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. ළමා අයිතිවාසිකම් සඳහා පදනම් වන මූලධර්ම කෙටියෙන් දක්වන්න.

02. ළමයාගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීමෙහි ලා ශ්‍රී ලංකා රජයයන් මෙතෙක් ගෙන ඇති වැදගත් පියවර පහක් **(05)** ලැයිස්තු ගත කරන්න.

03. ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා උපයෝගී කරගත හැකි ළමා අයිතිවාසිකම් ඇතුලත් ප්‍රධාන තොරතුරු මූලාශ්‍ර තුනක් **(03)** නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

04. ශ්‍රී ලංකාවේ ළමා සුරක්ෂණ අධිකාරිය සතු ප්‍රධාන භූමිකා තුනක් **(03)** ලියන්න.

05. විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය මගින් සපයා ඇති සේවාවන් තුනක් **(03)** දක්වන්න.

06. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය සහමුලින්ම නැති කිරීමට නොහැකි වීම කෙරෙහි බලපා ඇති හේතු දෙකක් **(02)** උදාහරණ සමගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමෙන් ඇතිවන වාසි පහක් **(05)** පෙන්වා දෙන්න.

08. පාසල තුළදී ළමයින්ගේ සහභාගිත්ව අයිතිය සුරැකීමට නාට්‍ය හා රංග කලා ගුරුවරයාට ගත හැකි ක්‍රියාමාර්ග පහක් **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ළමා අයිතිවාසිකම් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ළමයින් සතුවිය යුතු අයිතිවාසිකම් පිළිබඳව පාසල තුළදී හඳුන්වා දීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (අවම වශයෙන් ක්‍රියාමාර්ග තුනක් උදාහරණ සහිතව පෙන්වා දෙන්න.) (ලකුණු 08)

(iii) ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා පාසලේ නාට්‍ය හා රංගකලා ගුරුවරයා සතු කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 10)

10. (i) ක්‍රි.ව.1939 අධ්‍යාපන ආඥා පනත මගින් ශ්‍රී ලාංකික ළමයින්ගේ තත්ත්වය වැඩි දියුණුවට ගත් වැදගත් පියවර තුනක් **(03)** පෙන්වා දෙන්න. (ලකුණු 04)

(ii) නිදහසින් පසු ශ්‍රී ලාංකික ළමයින්ගේ සෞඛ්‍යය තත්ත්වය වැඩි දියුණුවට ලක් රජය ගත් වැදගත් ක්‍රියාමාර්ග තුනක් **(03)** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ඉහත සඳහන් කළ ක්‍රියාමාර්ගවල දක්නට ලැබෙන අඩුපාඩු පෙන්වා දෙමින් ඒවා අවම කිරීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

11. (i) වර්ධනය හා සංවර්ධනය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ළමයාගේ පෞරුෂ සංවර්ධන අවශ්‍යතාව සපුරාලීම සඳහා ගුරුවරයෙකුට කළ හැකි වැදගත් කාර්යයන් හතරක් **(04)** විමසන්න. (ලකුණු 08)

(iii) ළමයින්ගේ සංවර්ධනයේ පහත අංග වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා රජයට ගත හැකි පියවර උදාහරණ මගින් පෙන්වා දෙන්න.

(අ) කායික සංවර්ධනය

(ආ) නිර්මාණාත්මක සංවර්ධනය (ලකුණු 08)

12. (i) ළමා අයිතිවාසිකම් කමිටුවේ සංයුතිය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ළමා අයිතිවාසිකම් කමිටුවේ ප්‍රධාන කාර්යයන් හතරක් **(04)** ලියන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ ජාතික මෙහෙයුම් කමිටුවේ ප්‍රධාන කාර්යයන් හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 08)

13. (i) "ළමා අයිතිවාසිකම් පිළිබඳ සන්නිවේදනයෙහි ලා පාසල් ගුරුවරයා සතු භූමිකාව" පිළිබඳව සුදුසු උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 10)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සන්නිවේදනයෙහි ලා ගුරුවරයාගේ භූමිකාව වැඩිදියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

14. (i) ශ්‍රී ලංකා රජය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විභාග කරන්න. (ලකුණු 06)

(ii) ඉහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී රජය මුහුණ දුන් ගැටලු සඳහන් කරන්න. (ලකුණු 06)

(iii) ඉහත ඔබ සඳහන් කළ ගැටලු මගහරවා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(හිමිකම් ඇවිරිණි.)